**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2016**

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම, කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණනය මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රමිති අංක 07 ප්‍රකාරව ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ නමුත් දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.84,383,159 ක දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට අවසන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති තොගය ශේෂය රු.425,959 ක් වූ අතර, භෞතිකව පරීක්ෂාකර ගණනය කරන ලද අවසන් තොග ශේෂය රු.3,526,748 ක් විය. ඒ අනුව රු.3,100,789 ක් අඩුවෙන් අවසාන තොග ශේෂය ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි සඳහා ක්ෂයවීම් රු. 11,657,139 ක් වැඩියෙන්ගණනය කර තිබුණි.

#### 2.2.3 නොසැසඳුනු ගිණුම්

------------------------

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ගිණුම් ශේෂ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් ශේෂ සමඟ සැසඳීමෙදී පහත සඳහන් නොසැසදීම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ ගිණුම් අනුව | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව | ශ්‍රී ලංකාසංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් අනුව | වෙනස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| (අ) ලැබිය යුතු ශේෂ සහ ණයගැතියෝ | 8,487,711 | 6,512,810 | - | 1,975,901 |
| (ආ)ණයහිමියෝ | - | 5,849,528 | - | 5,849,528 |
| (ඇ)ණයගැතියෝ | 3,774,878 | - | 114,626 | 3,660,252 |

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| (i) වෙළඳ ණයගැතියෝ | 22,302,688 | ශේෂ සනාථ කිරීම |
| (ii) තැන්පතු සහ වෙනත් ලැබීම් | 3,492,000 | ශේෂ සනාථ කිරීම |
| (ආ) ස්ථාවර වත්කම් (2008 වර්ෂයේ ආරම්භක ශේෂය) | 128,373,195 | ශේෂ සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක ලේඛන |
| (ඇ) ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති සංවර්ධන පිරිවැය | 1,788,459 | විස්තරාත්මක උපලේඛනය |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ ණයගැතියන් යටතේ දක්වා තිබූ ශේෂ වලින් රු. 16,140,932 ක් වර්ෂ 01 කට වැඩි 03 කට අඩු කාලයක්ද, රු.6,161,757 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ශේෂවලින් සමන්විතව තිබුණි.එකී ලැබිය යුතු ශේෂවලින් 2019 වර්ෂයේ මැයි මස වන විටත් රු.20,799,543 ක් වූ වෙළඳ ණයගැති ශේෂයන් අයකර ගෙන නොතිබුණි.

(ආ) උපචිත වියදම් යටතේ දක්වා තිබූ ශේෂවලින් රු.1,883,486 ක් වර්ෂ 02 කට වැඩි කාලයක්ද රු.641,735 ක් වර්ෂ 01 කට වැඩි 02 කට අඩු කාලයක්සහිත ශේෂ වලින් සමන්විත වී තිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | විස්තරය |
| --- | --- |
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ<br>(අ) 4.2.5 වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස ණයගැති හා ණයහිමිකාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණය සහ පැරණි,යල්පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 8.3.9වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් වියදම් දැරිය නොහැකි වුවත් ඉන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී රු.4,887,871 ක මුදලක් ලී බඩු මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. |

**2.5 අධිකාර බලය නොමැති ගනුදෙනු**

**--------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ**

| ගනුදෙනුවේ ස්භාවය | ගනුදෙනුවේ විස්තරය | වටිනාකම<br>රු. | නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| නවාතැන් ගාස්තු | සමුද්‍රා හෝටලයේ කාමර සඳහා නවාතැන් ගාස්තු | 4,050,000 | සමුද්‍රා පුහුණු හෝටලයේ කාමර අංක 202 හි , 2016 මැයි මස 25 වන දින සිට 2017 අගෝස්තු මස 17 දින දක්වා බාහිර පාර්ශවයක් විසින් නවාතැන් ගෙන සිටි අතර නවාතැන් ගාස්තු වශයෙන් අයවිය යුතු මෙම මුදල මේදක්වා අයකර නොතිබුණි. ඉහත නවාතැන් පහසුකම් ලබා දීමේදී කළමනාකරණය විසින් කිසිදු අත්තිකාරම් මුදලක් ලබාගැනීම හෝ ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව ලබා දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.132,127,218ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.112,721,045ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහිරු. 19,406,173ක වර්ධනයක් දැක්වුණි. සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය වියදම රු. 48,150,555 කින් වැඩි වුවද සංචාරක සංවර්ධන බදු ආදායම රු.16,085,375 කින් සහ අපගමන බදු ආදායම රු.46,428,021 කින්වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට මූලික හේතුව වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා වර්ෂ 05ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබිණි. 2015වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සියයට 17.2ක් විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේදී රු.168,578,186 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණු අතර එය 2016 වර්ෂයේදී රු.353,488,244 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ආදායම රු.මිලියන 532ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 442සමඟ සැසඳීමේදී සියයට 20.36 ක වර්ධනයක් විය. එසේම ඉකුත් වර්ෂයේදී ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 329 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 399ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 21.27ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අදාලව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. එබැවින් ආයතනයේ කාර්යසාධනය ඇගයීමේ ඵලදායී පාලන කාරකයක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම යොදාගත නොහැකි බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් හෝටල් කළමනාකරණ ආයතනයට ජාතික වෘත්තීය සුදුසුකම(NVQ),ලබාගැනීම සඳහා උපදේශකත්වය හා සහායන් ලබා දුන්නද ආයතනය මේදක්වා ජාතික වෘත්තීය සුදුසුකම සහිතව පාඨමාලා හඳුන්වා දීමට නොහැකි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කලමනාකරණ ආයතනයට අයත් ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය මේ දක්වා නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඇ) ආයතනය විසින් අනාගත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීමේ අරමුණෙන් 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ විශ්‍රාම පාරිතෝෂික මුදල වූ රු.11,910,882 ක මුදල 2013 ඔක්තෝබර් 30 දින සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබූ නමුත් 2016 වර්ෂයේ අවසානයට ගෙවිය යුතුව තිබූ විශ්‍රාමික පාරිතෝෂික මුදල වූ රු. 29,530,921 කින් ඉතිරි මුදල වූ රු. 17,620,039 ක් වෙනුවෙන් අවශ්‍ය ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමුද්‍රා හෝටලය සඳහා මත්පැන් බලපත්‍රයක් නොමැති වීම නිසා, අලෙවි කිරීමට නොහැකිව, 2013 වර්ෂයේ සිට පැවත එන රු.83,540 ක් වූ සැර බීම තොගය අලෙවිකර නොහැකිව නිශ්ක්‍රියව පැවතුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

සමුද්‍රා හෝටලයේ වර්ෂය තුල ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර රාත්‍රී (Room Nights) 3660 පවතින අතර එයින් ආයතනයට ලහාකර ගත හැකි වූයේ හෝටල් කාමර රාත්‍රී 794 ක් හෙවත් සියයට 22 ක් පමණි.

## 4.4 වාහන උපයෝජනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය තම පරිහරණය සඳහා යොදා ගෙන තිබුණු වාහනයක් නීත්‍යානුකූල හිමිකාරීත්වය තම ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වීමකින් තොරව පෞද්ගලික ආයතනයට ප්‍රවාහන සේවාව සැපයීම වෙනුවෙන් ආයතනය විසින් 2014 වර්ෂයේදී රු.440,155 ක්ද , 2015 වර්ෂයේදී රු.1,697,960 ක් සහ 2016 වර්ෂයේදී රු.509,536 ක් ගෙවා තිබුණි.

## 4.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

--------------------------

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කොළඹ හෝටල් පාසලේ ශිෂ්‍යයන් වෙනුවෙන් ආහාර අමු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේ රු.4,994,817 ක මුදලක් වැය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 02 ක ප්‍රමාද කාලයකින් පසුව 2019 අප්‍රේල් 18 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරවඅභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් විෂයයන් 16 ක අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 26 සිට සියයට 158 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් 2014වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2019අගෝස්තු 20 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

2014 සහ 2015 වර්ෂවල විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ පහත අඩුපාඩු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් වී නොතිබුණි.

(අ) හෝටල් පාසල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන මත්පැන් වර්ග ගබඩාවට භාර නොදී ආහාරපාන අංශයේ ප්‍රධානියා භාරයේ ලේඛනගත කිරීමකින් තොරව තබා තිබුණි. එම තොග භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි රු.35,000 ක් වටිනා වයින් බෝතල් 12 ක් අස්ථානගත වී, තවත් මත්පැන් බෝතල් 06 ක හිඟයක් නිරීක්ෂණය වූ අතර එකී මත්පැන් ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ද යොදාගත් බවට සාක්ෂි නොතිබුණි.

(ආ) 2013 අප්‍රේල් මාසයේ සිට 2014 ජුනි 30 දින දක්වා ආයතනයේ කාර්ය මණ්ඩලයට ලොන්ඩ්‍රි සේවා සැපයීම හේතුවෙන් දැරීමට සිදු වූ ඍජු පිරිවැය රු.887,028ක් පමණ විය.මෙම පිරිවැය කාර්යය මණ්ඩලයෙන් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ආයතනයේ ආහාරපාන අංශයට බඳවා ගත් බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකුට 2013 වර්ෂයේ මාර්තු මාසයේ සිට 2014 වර්ෂයේ ජුනි මාසය දක්වා පංති වාර්තා පොත් අනුව වැඩ කළ දේශන පැය ප්‍රමාණය ඉක්මවා රු.972,865 ක් ගෙවීම් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් කළමනාකරණය

(ආ) අයවැය පාලනය